දමන ප්‍රාදේශීය සභාව - 2024

----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

දමන ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172(1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උප වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට දමන ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව

විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක හා සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුව ද අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථය ද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව,

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාතර්ාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේ මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතුව පැවති හිඟ දැන්වීම් පුවරු ආදායම් රු.147,375 ක් ගිණුම්ගත කර නොතිබුණි.	දැන්වීම් පුවරු සඳහා හිඟහිටි ශේෂයන් ලේඛනගත නොකරන හෙයින් 2024 වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු මුදල ගිණුම් ගත කර නොමැති බව.	හිඟහිටි ආදායම හඳුනාගෙන ලේඛන ගත කර නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු පොලී ආදායම රු.654,518 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	එම වරද නිවරදි කිරීමට කටයුතු කරන බව.	ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	2023 වර්ෂයට අදාළ මුද්දර ගාස්තු රු.1,253,090 ක මුදලක් හිඟහිටි මුද්දර ගාස්තු ගිණුමේ සටහන් කර නොතිබුණි.	පිළිගනිමි. හිඟහිටි මුද්දර ගාස්තු ගිණුම් තැබීමේදී සිදු වූ දෝශය නිවරැදි කිරීමට කටයුතු කරන බව.	හිඟ හිටි ආදායම් නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6.2 නොසැසඳූ පාලන ගිණුම් හෝ වාතර්‍ා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වර්ෂය තුළ ශුද්ධ මුදල් චලනයට වර්ෂ ආරම්භක මුදල් හා මුදල් සමාන දෑ එකතු කළ පසු වටිනාකම රු.78,959,959 ක අගයක් විය. එබැවින් වර්ෂ අවසාන මුදල් හා මුදල් සමාන දෑ වල වටිනාකම රු.5,381,226 ක් වූයෙන් ඒ අතර රු.73,578,733 ක නොසැසඳීමක් නිරීක්ෂණය විය.	පිළිගනිමි. මේ සම්බන්ධව පරීක්ෂා කර අදාළ වරද නිවරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි.	මුදල් ප්‍රවාහ ප්‍රකාශය නිවරදි සකස් කළ යුතුය.
(ආ)	සමාලෝචිත වර්ෂයේ සැපයුම් උපකරණ හා මූලධන ආධාර ලෙජර් ගිණුම අනුව ආදායම් වියදම් ගිණුමට මාරු කරන ලද වටිනාකම	පිළිගනිමි. මේ සම්බන්ධව පරීක්ෂා කර අදාළ වරද නිවරදි	නොසැසඳීම් හඳුනාගෙන ඒවා නිවැරදි කළ යුතුය.

සහ ආදායම් වියදම් ගිණුමේ සටහන්ව තිබූ වටිනාකම අතර රු.1,140,216 ක වෙනසක් පැවතුණි.	කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි.	

1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු එකතුව රු.4,294,657 ක් වූ ගිණුම් විෂයන් 11කට අදාළව අදාළව ස්ථාවර වත්කම් ලේඛන, උපලේඛන, ශේෂ සනාථ කිරීම් හා ගෙවිය යුතු පාර්ශවය සහිත උපලේඛන යනාදී සාක්ෂි ඉදිරිපත් නොවීම නිසා සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය කිරීමට නොහැකි විය.	2010 හෝ ඊට පෙර සිට ඉදිරියට එන මෙම වටිනාකමට මිලදී ගැනීම් සම්බන්ධව තොරතුරු කිසිවක් නොමැත.	මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ගිණුම් තහවුරු කෙරෙන සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.
(ආ)	අර්ධ නිමි වැඩ ලෙස ශේෂ පත්‍රය තුළ දක්වා ඇති රු.497,303 ක මුදල වැයකර සිදුකරන ලද ඉදිකිරීමට අදාළ නිශ්චිත වියදම දරා ඇත්තේද යන්න තහවුරු කර ගැනීම සඳහා අවශ්‍ය විගණන සාක්ෂි ප්‍රමාණවත් පරිදි ඉදිරිපත් නොවුණි.	වසර ගණනාවක සිට ඉදිරියට එන මෙම අර්ධ නිමි වැඩ ලෙස දක්වා ඇති ශේෂය සම්බන්ධ තොරතුරු තහවුරු කර ගැනීමෙන් අනතුරුව, මෙම ශේෂය ගිණුම්වලින් ඉවත් කිරීමට කටයුතු කරන බව.	නිවැරදි තොරතුරු හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති			
	(i) 5 (xii) රීතිය	මුදල් හා ගබඩා කටයුතු පිළිබඳව වගකිව යුතු නිලධාරීන් වෙතින් ප්‍රමාණවත් ඇපකර ලබා ගැනීමට පියවර ගෙන නොතිබුණි.	මේ වන විට මුදල් සහකාර, ගබඩා විෂය භාර නිලධාරීගෙන් සහ රියදුරන්ගෙන් ඇපකර ලබා ගෙන ගිණුම් ආරම්භ කර ඇති බව.	මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.

	(ii) 218 රීතිය	සභාව සතු සියලු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳව සෑම වර්ෂයකටම වරක් හෝ පරීක්ෂා කිරීමට කටයුතු කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී ඉඩම් ගොඩනැගිලි පරීක්ෂාවක් කිරීමට කටයුතු කරන බව.	මූල්‍ය හා පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි			
	(i) භාණ්ඩාගාර ලේකම්ගේ අංක 01/2020 හා 2022 අගෝස්තු 18 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛයෙන් සංශෝධිත මුදල් රෙගුලාසි 371(2) (ආ)	කිසියම් විශේෂිත කාර්යයක් සඳහා මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් එක් අවස්ථාවක දී රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබාදිය හැකි වුවත් දමන ප්‍රාදේශීය සභාවේ මාණ්ඩලික නොවන නිලධාරීන් වෙත අවස්ථා 10 කදී රු.100,000 ක සීමාව ඉක්මවා රු.162,500 ක අත්තිකාරම් ලබා දී තිබුණි.	පිළිගනිමි. මෙම අත්තිකාරම් මුදල්, කාර්යාලයේ විවිධ කටයුතු වෙනුවෙන් ලබා දී ඇති බවත්, එම අත්තිකාරම් නැවත ප්‍රතිපූර්ණය කර ඇති බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව නිශ්චිත සීමාව තුළ අත්තිකාරම් ලබාදිය යුතුය.
	(ii) මුදල් රෙගුලාසි 571	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට තැන්පත් උපලේඛන අනුව ගෙවිය යුතු පාර්ශවයන් හඳුනා නොගත් රු.3,004,349 ක් වටිනා ටෙන්ඩර්, කොන්ත්‍රාත් හා විවිධ තැන්පත් ශේෂයන් සහ තැන්පත් කළ දින සිට වසර දෙකක කාලය ඉක්ම වූ තැන්පතු ශේෂයන් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.	පිළිගනිමි. ඉදිරියේදී මෙම ශේෂයන් සම්බන්ධව මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කිරීමට අපේක්ෂා කරමි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.692,077 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.4,766,125 ක් විය.

2.2 මූල්‍ය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
ප්‍රාදේශීය සභාවට අයත් බැංකු ගිණුමට අදාළ බැංකු සැසඳුම් ප්‍රකාශනයේ 2022 වර්ෂයේ ජනවාරි මස සිට බැංකුවේ වැරදි ලෙස සටහන් කර ඇති රු.150,000 ක මුදල නිරවුල් කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	අනුමැතිය ලද වහාම අංක 5719951 දරණ ගිණුමේ ඇති මුදල් අංක 5719952 දරණ ගිණුමට මාරු කර, 5719951 දරණ ගිණුම අවලංගු කිරීමට කටයුතු කරන බව.	බැංකුව සිදුකර ඇති වරද නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය.

2.3 ආදායම් පරිපාලනය

2.3.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023			
	ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල්කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම්	බිල්කළ ආදායම්	රැස්කළ ආදායම්	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
		රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
i.	වරිපනම් හා බදු	420,906	420,906	309,087	1,671,285	770,900	797,578	850,683	1,746,621
ii.	කුලී ආදායම	2,638,800	2,680,800	2,717,616	2,389,694	4,912,500	5,485,829	4,709,536	2,653,016
iii.	බලපත්‍ර ගාස්තු	2,644,500	516,250	432,500	83,750	1,712,500	1,052,900	1,052,900	83,750
iv.	වෙනත් ආදායම්	1,853,500	1,361,997	1,361,997	–	1,175,000	1,270,523	1,270,523	–
v.	එකතුව	7,557,706	4,979,953	4,821,200	4,144,729	8,570,900	8,606,830	7,883,642	4,483,387

2.3.2 ආදායම් රැස්කිරීමේ කායර්සාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේර්ශය
(අ)	2024 දෙසැම්බර් 31 දිනට අයකර ගත යුතු වරිපනම් හිඟය රු.1,709,403 ක් වූ අතර එය වාර්ෂික තක්සේරු වටිනාකම වන රු.420,907 ක් මෙන් හතර ගුණයකට අධික මුදලක් විය.	ආදායම් පරීක්ෂකවරයෙක් වසර 03ක පමණ කාලයක සිට නොමැති වීම සෘජුවම බලපා තිබුණි. මෙම වසර තුළ ආදායම් පරීක්ෂකවරයෙකු අප කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති හෙයින්, වරිපනම් බදු අය කර ගැනීමට අපේක්ෂා කරන බව.	මුල්‍ය පරිපාලන රීති ප්‍රකාරව කටයුතු කළ යුතු අතර හිඟ ආදායම් කඩිනමින් අයකර ගත යුතුය.
(ආ)	දීර්ඝ කාලයක සිට අය නොවී පවතින අක්කර බදු වටිනාකම රු.230,850ක් නිරවුල් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	වසර ගණනාවක සිට ඉදිරියට ගෙන එන ශේෂයක් වන අතර, මේ පිළිබඳ තොරතුරු කිසිවක් නොමැති වීමෙන් අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට හැකියාවක් නොමැති බව.	නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	2024 දෙසැම්බර් 31 දිනට හිඟ කඩ කුලී රු.2,621,066 ක් වූ අතර එම ශේෂය වසර 01 සිට 03 කට වැඩි කාලයක සිට අයකර ගත යුතු හිඟ ශේෂ 31 කින් සමන්විත විය.	ආදායම් පරීක්ෂකවරයෙක් වසර 03ක පමණ කාලයක සිට නොමැති වීම සෘජුවම බලපෑ බව.	හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ඈ)	වසර 05 කට වඩා පැරණි රු.103,045 ක හිඟ මුද්දර ගාස්තු ගිණුම්වල ඉදිරියට ගෙන එමින් පවතින අතර එම ශේෂ සත්‍ය වශයෙන්ම සභාවට ලැබිය යුතු ශේෂ ද යන්න තහවුරු කරගෙන ලබාගැනීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	2023 ඔක්තෝබර් සිට 2024 දෙසැම්බර් 31 දක්වා ලැබිය යුතු මුද්දර ගාස්තු ආදායම හඳුනාගෙන ගිණුම්ගත කිරීමටත්, වර්ෂ ගණනාවක සිට ගිණුම්වල ඉදිරියට එන ශේෂ තහවුරු කර ගැනීමටත් ඉදිරියේදී කටයුතු කරන බව.	වර්ෂයට අදාළ ආදායම් නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කායර්යන් ඉටු කිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු සියලු කාර්යයන් හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට 2024 දෙසැම්බර් 31 දින වන විට ද කටයුතු කර නොතිබුණි.	මේ වන විට අප සභාව අතුරු ව්‍යවස්ථා 5 ක් පනවා ඇති අතර, ඉදිරියේදී අතුරු ව්‍යවස්ථා පැනවිය යුතු සියලු කාර්යයන් හඳුනාගෙන අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කරන බව.	නව අතුරු ව්‍යවස්ථා ඇති කරගත යුතු අතර අතුරු ව්‍යවස්ථාවේ පනවා ඇති කටයුතු නීත්‍යානුකූල කර ගත යුතුය.

3.2 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභාවේ හිටපු සභාපතිවරයා විසින් 2022 මැයි 09 වන දින සභාව සතු කැබ් රථය පළාත් පාලන කොමසාරිස්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව කොළඹ පැවති රැස්වීමට සහභාගී වී ආපසු පැමිණීමේ දී කලහකාරී සිද්ධියට මැදි වී කැබ් රථයට පහර දී ගිනි තැබීම හේතුවෙන් කැබ් රථය මුළුමනින්ම හානියට පත් වී තිබූ අතර මුදල් රෙගුලාසි 104(3) ප්‍රකාරව ඉදිරිපත් කළ ප්‍රාරම්භක වාර්තාව අනුව රථයට සිදුව තිබූ අලාභය රු.8,500,000 ක් වුවත් රක්ෂණ වන්දි ලෙස ලද මුදල රු.5,000,000 ක් වූයෙන් ප්‍රාදේශීය සභාවට රු.3,500,000 ක අලාභයක් සිදු වී තිබුණි. මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා නිර්දේශ ක්‍රියාත්මක කිරීමකින් තොරව සමාලෝචිත වර්ෂයේදී කැබ් රථයේ වටිනාකම ද පොත්වලින් ඉවත්කර තිබුණි.	පිළිගනිමි. අවශ්‍ය ඉදිරි කටයුතු කිරීමට පියවර ගනු ලබන බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව විධිමත් පරීක්ෂණයක් පවත්වා එහි නිර්දේශ ක්‍රියාත්මක කිරීමට හා අනුමැතිය ලබාගෙන වටිනාකම පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2023 ජූලි 18 දින පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලයෙන්	පිළිගනිමි. එය ගිණුම්ගත	වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

	පරිත්‍යාග ලෙස ලද මුද්‍රණ යන්ත්‍රයේ (Epson dot printer LQ - 310) වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	කිරීමට කටයුතු කරන බව.	
(ආ)	දැන්වීම් පුවරු 108 කින් 2024 වර්ෂයට අදාළව රු.1,082,250 ක් හිඟව පවතින අතර එම හිඟ මුදල අය කර ගැනීමට හෝ නොගෙවන දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි.	ආදායම් පරීක්ෂකවරයාගේ සහාය ලබා ගෙන ප්‍රදර්ශනය වන ප්‍රචාරක දැන්වීම් පුවරු පිළිබඳ තහවුරු කර ගැනීමෙන් අනතුරුව අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන බව.	හිඟ ගාස්තු අයකර ගැනීමට හෝ දැන්වීම් පුවරු ගලවා ඉවත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඇ)	පොදු වෙළෙඳපල, ග්‍රාම 07 මුවංගල, හිඟරාණ වෙළඳ සංකීර්ණයයට අයත් කඩ 44 ක් සඳහා වූ හිඟ මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉදිරියේදී හිඟ මුදල් අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ මුදල් කඩිනමින් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.

3.4 නිෂ්කායර් හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	සභාව සතුව භාවිත කළ නොහැකි තත්ත්වයේ පවතින වාහන 09 ක් නිෂ්කාර්යව පැවතුණි.	භාවිතා කළ නොහැකි තත්වයේ පවතින වාහන සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු ඉදිරියේ දී සිදු කරන බව.	වාහන වල අයිතිය සභාව වෙත පවරා ගෙන ඒවා වෙන්දේසි කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කළ යුතුය.
(ආ)	වෘත්තීය පුහුණුකරුවකු හා ආදායම් ඉලක්ක සකස් කර නොමැති නිසා ප්‍රාදේශීය සභාව සතු කාය වර්ධන මධ්‍යස්ථානයේ රු.1,496,025 ක උපකරණ 2022 වර්ෂයේ සිට නිෂ්කාර්යව පැවතුණි.	පිළිගනිමි .ටෙන්ඩර් ලබා දී කාය වර්ධන මධ්‍යස්ථානය ආරම්භ කිරීමට සූදානම් කර ඇති බව	නිවැරදි ආදායම් ඉලක්ක හඳුනාගෙන උපකරණ කාර්යක්ෂමව උපයෝජනය කරගත යුතුය.

3.5 වත්කම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
(අ)	මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර තිබූ ඉඩම් ගොඩනැගිලි උපලේඛනය අනුව සභාවට අයත් ගොඩනැගිලි වටිනාකම ගිණුම්ගත කර තිබුණ ද එම ගොඩනැගිලි පිහිටි ඉඩම්වල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ඉඩම් තක්සේරුවක් සිදු කර නොමැති අතර, සභාවේ ආදායම් තත්ත්වය අනුව ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව.	දේපළ වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.

(ආ)	සභාවට අයත් සුසාන භූමි 27 ක හා ක්‍රීඩා පිටි 10 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	වත්කම් ලේඛනයට ඇතුළත් කර තිබුණ ද තක්සෙරුවක් කර නොමැති බැවින් වටිනාකමක් හඳුනාගැනීමට නොහැක. එහෙයින් සභාවේ ආදායම් තත්ත්වය අනුව ඉදිරියේදී ඒ සම්බන්ධව කටයුතු කිරීමට බලාපොරොත්තු වන බව.	වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සභාව සතු මෝටර් රථ හා කරත්ත අයිතම 07 ක වටිනාකම හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.	යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ යටතේ වාහන දෙකක වටිනාකම ඇතුළත් කර ඇති වාහන පහක වටිනාකම පිළිබඳ කිසිදු ලේඛනයක් සභාව සතුව නොමැති බව.	වටිනාකම් හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය.
(ඇ)	සභාව භාරයේ පවතින වාහන 09 ක අයිතිය සභාවේ නමට පවරා ගැනීමට ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	වාහන අයිතිය පවරා ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව.	අයිතම සභාව නමට පවරාගැනීමට කටයුතු කළ යුතුය.

3.6 ව්‍යාපෘති, කතර්ව්‍යන් හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේර්ශය
සමාලෝචිත වර්ෂයේ එකතු වටිනාකම රු.599,548 කට අදාළ ව්‍යාපෘති 03 ක් සඳහා යෝජනා සම්මත වී තිබුණ ද සභාව විසින් එම ව්‍යාපෘති ආරම්භ කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර නොතිබුණි.	ව්‍යාපෘතිය අනුමත වී එහි ඉදිකිරීම් අවසන් කළ යුතු කාලය අවසන් වනතෙක් එම ඇළ මාර්ගයේ ජලය ගලා යාම හේතුවෙන් ඇස්තමේන්තුගත මුදලින් එම ව්‍යාපෘතිය සිදු කිරීමට නොහැකි වූ බව.	අදාළ ව්‍යාපෘති ආරම්භ නොකිරීමට හේතු සොයා ඉදිරි කටයුතු සිදුකළ යුතුය.

3.7 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදේර්ශය
(අ)	සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ අනුමත කාර්යය මණ්ඩලයට අයත් තනතුරු 10 ක නිලධාරීන් 19 දෙනෙකුගේ පුරප්පාඩු පැවතුණි. ඒ අතර ආදායම් පරිපාලක තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතීම හේතුවෙන් වාර්ෂිකව සමීක්ෂණ පැවැත්වීම, හිඟ ආදායම් රැස් කිරීම, හිඟ ආදායම් පැහැර හරින්නන් සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ග ගැනීම යනාදී කටයුතු ඉටුකළ නොහැකිව පැවතුණි.	පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අවස්ථා කිහිපයක දීම අප ඉල්ලීම් කර ඇතත්, මේ වන තෙක් පුරප්පාඩු සඳහා නිලධාරීන් අනුයුක්තයක් සිදු වී නොමැති බව.	පුරප්පාඩු සම්පූර්ණ කර ගැනීමට කටයුතු කළ යුතුය.

4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 විගණන කමිටුව

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ 2019 ජනවාරි 12 දිනැති අංක DMA/01–2019 දරන අභ්‍යන්තර විගණන මාර්ගෝපදේශ පිළිබඳ චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂයේ සභාව විසින් විගණන සහ කළමනාකරණ කමිටු ස්ථාපිත කර කමිටු රැස්වීම් පවත්වා නොතිබුණි.	විගණන කමිටු ස්ථාපිත කර ඇති අතර, කමිටු රැස්වීම් පැවැත්වීමටද කටයුතු කරන බව.	රැස්වීම් පැවැත්වීමට පියවර ගත යුතුය.

4.2 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
සමාලෝචිත වර්ෂයේ ප්‍රාදේශීය සභාවේ අයවැය ගත ආදායම් වියදම් හා සත්‍ය ආදායම් වියදම් පරීක්ෂාවේදී ආදායම් විෂයන් 04 ක සියයට - 12 සිට සියයට 55 දක්වා ද, වියදම් විෂයන් 06 ක සියයට 43 සිට සියයට 143 දක්වා ද විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය මූල්‍ය මහපෙන්වීමක් ලෙස භාවිතා කර නොමැති බව නිරීක්ෂණය විය.	අයවැය සකස් කරනු ලබන්නේ ආයතනයට අනුමත කාර්ය මණ්ඩලයට වීම මෙයට හේතු වී ඇති බව.	අයවැය ලේඛන මූල්‍යමය මහ පෙන්වීමක් ලෙස භාවිතා කිරීමට හැකිවන ලෙස පිළියෙළ කළ යුතුය.

4.3 තිරසාර සංවධර්න අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිදෙර්ශය
2017 අංක 19 දරන තිරසර සංවර්ධන පනත ප්‍රකාරව තිරසර සංවර්ධන අරමුණු හා පරමාර්ථ ළඟාකර ගැනීම සඳහා අවශ්‍ය දත්ත රැස්කර ඒ සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැලසීමට සභාව විසින් ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	ඉදිරියේදී කරනු ලබන සංවර්ධන ව්‍යාපෘති වලදී තිරසාර සංවර්ධන අරමුණු හා ඉලක්ක ළඟා කර ගැනීම සම්බන්ධව දැඩි අවධානයක් යොමු කර කටයුතු කරමි.	තිරසාර සංවර්ධන දර්ශකයක් ස්ථාපිත කර ඒවායේ ක්‍රියාකාරීත්වය ඇගයීම කළ යුතුය.